# හැඳින්වීම

අදියර හතරකින් සමන්විත මෙම සම්පූර්ණ විෂය නිර්දේශය සකස්කර ඇත්තේ ශිෂ්‍යයින්ට න්‍යායාත්මක දැනුමක් සහ කළමනාකරණ ගණකාධිකාරිවරයෙකු ලෙස කාර්යයේ යෙදීම සඳහා කුසලතා ලබා ගැනීම පිණිස වන අතර පහත විස්තරකර ඇති විෂය නිර්දේශය අපේක්ෂිත අරමුණ සහ විභාගයේ එක් එක් මාතෘකාව සඳහා අවශ්‍ය දැනුමේ මට්ටම පැහැදිලිව සඳහන් කර ඇත. කෙසේ නුමුදු එක් එක් මාතෘකාවෙන් අපේක්ෂිත දෑ නියත වශයෙන්ම සඳහන් කිරීමට අසීරු බැවින්, විභාගවලට සූදානම්වීමේදී ශිෂ්‍යයින්ට විෂය නිර්දේශයේ භාවිතාකර ඇති පද ගැඹුරු ලෙස නිර්වචනයකිරීමට පොළඹවනු ලැබේ.

කළමනාකරණ ගිණුම්කරණය මෑත කාලයේදී ඉතා ඉක්මනින් විකාශයට පත් විෂයකි. මෙම විෂය සංවිධානවල වෙනස්වන තොරතුරු අවශ්‍යතාවයන්ට සරිලන ලෙස වෙනස්වන දේශපාලන, ආර්ථික සහ සමාජයීය පරිසරයක ක්‍රියාත්මක වෙයි. එබැවින් ශිෂ්‍යයින්ද ව්‍යාපාරික ලෝකයේ වෙනස්වන ප්‍රවනතාවයන් පිළිබඳ අවශ්‍යයෙන්ම අවධානයෙන් සිටිය යුතුය. හොඳ දිනපතා පුවත් පතක් සහ සති අන්ත පුවත්පතක් කියවීම (විශේෂයෙන් ව්‍යාපාරික තොරතුරු) අනිවාර්යයෙන්ම කල යුතුය. මෑතදී සිදුවූ සීඝ්‍ර දියුණුව පිළිබඳ දැනුමක් ලබාගැනීම පිණිස ජාත්‍යන්තර තත්ත්වයන් පිළිබඳ ක්‍රියාකරණ "එකොනොමිස්ට්" වැනි සඟරාවක් කියවීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. එමෙන්ම "සී.එම්.ඒ කැනඩා" හි, "කළමණාකරණ සඟරාව" වැනි මූල්‍ය සහ කළමණාකරණ ආයතනයක් මගින් පලකරන සමහර සඟරා කියවිය යුතුය. අවසාන වශයෙන් වර්තමාන වාර්තාකරණ පරිචයන් පිළිබිඹුකරන ප්‍රකාශිත වාර්ෂික වාර්තා හැදෑරීමද හොඳ අදහසකි.

<u>විභාග ව්‍යුහය</u>

ආයතනයේ අධ්‍යයන පාඨමාලාව අදියර හතරකින් සමන්විතය ඒවා නම්,

අ) තාක්ෂණික අදියර
ආ) අන්තර්මධ්‍ය අදියර
ඇ) වෘත්තිය I අදියර
ඈ) වෘත්තීය II අදියර

ආයතනයේ විභාග වර්ෂයට දෙවරක් එනම් මාර්තු සහ සැප්තැම්බර් මාස වලදී පැවැත්වේ. වෘත්තීය II අදියරේදී මෙතෙක් ඉගෙනගත් න්‍යායාත්මක දැනුමට වැඩි වැදගත්කමක් දක්වන අතර එයට අමතරව පැය තුනක කාලයක ප්‍රත්‍යෙක අධ්‍යයන පත්‍රයකින්ද (Case Study) සමන්විතය. ප්‍රත්‍යෙක අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු අයදුම් කරුවන්ට විභාගයට මසකට පෙර ලබාදෙන අතර බලපාන තොරතුරු සහ ප්‍රශ්න විභාගය පැවැත්වෙන අවසථාවේ ලබාදෙනු ලැබේ.

සම්පූර්ණ විභාගය ප්‍රශ්න පත්‍ර 18 කින් සහ එක් ප්‍රත්‍යෙක අධ්‍යයන පත්‍රයකින් සමන්විතවේ. ශිෂ්‍යයෙකුට තම අභිමතය පරිදි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් ඕනෑම ප්‍රශ්න පත්‍ර හයකට (6) පෙනී සිටිය හැක.

- ශිෂ්‍යයින් සම්පූර්ණ අදියරකට හෝ අදියරක සමහර විෂයයන්ට පෙනී සිටිය යුතු අතර ඔවුන් ලබාගත් නිදහස් කිරීම් හෝ සාමාර්ථ නිශ්චය කිරීමෙන් පසු පිළිවෙලින් තාක්ෂණික අදියරේ සිට ඉහළට යා හැකිය.

- සමහර විෂයයන් එක් අදියරයකට වඩා වැඩියෙන් පරීක්ෂණයට ලක්වන අවස්ථාවන් හි විෂය නිර්දේශ අන්තර්ගතය පළමු අදියරේ සිට පස්චාත් අදියර දක්වා ක්‍රමාණුකූලව වර්ධනය කර ඇත. එබැවින් තාක්ෂණික අදියරේ මූල්‍ය ගිණුම්කරණ මූලධර්ම පත්‍රයට ද, අන්තර්මධ්‍ය අදියරේ මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය පත්‍රයට, වෘත්තීය 1 අදියරේ උසස් මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය පත්‍රයට ද පිළිවෙලින් පෙනී සිටිය යුතුය. එලෙසම අන්තර්මධ්‍ය අදියරේ උසස් කළමනාකරණ ගිණුම්කරණ පත්‍රයට පෙනී සිටීමට පෙර තාක්ෂණික අදියරේ කළමණාකරණ ගිණුම්කරණය මූලධර්ම විෂයයෙන් සමත්වීම හෝ නිදහස් වීම ලබා තිබිය යුතුයි.

- වෘත්තීය II අදියරට පෙනී සිටිය හැක්කේ ශිල්පීය අදියර, අන්තර්මධ්‍ය සහ වෘත්තිය I අදියරවල සියළුම විෂයන්ගෙන් සමත්වීමෙන් පසුවය.
- වෘත්තිය II අදියරේ සියළුම විෂයන්ට එක් වාරයකදී පෙනී සිටිය යුතුය.
- නියමයන්ට යටත් ශිෂ්‍යයින්, අදාල පරිදි වෙනත් ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට පෙර තාක්ෂණික අදියරේ BC I පත්‍රය සහ ව්‍යාපාර ගණිතය ප්‍රශ්න පත්‍රවලින් සමත්විය යුතුය.

## විෂය නිර්දේශ ව්‍යුහය

සංගමයේ අධ්‍යයන පාඨමාලාව අදියර හතරකින් සමන්විත වන අතර, තාක්ෂණික අදියර සහ අන්තර්මධ්‍ය අදියරයන් සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබන අතර **වෘත්තිය I අදියර සහ වෘත්තීය II අදියර පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.**

# විෂය නිර්දේශ මාතෘකා පිළිබඳ උපදෙස්

විෂය නිර්දේශයේ එක් එක් මාතෘකාවේ අවශ්‍ය කුසලතා මට්ටම පහත විස්තර කර ඇති පරිදි වේ.

දැනුම

මෙය ඉගෙනීමේ වඩාත් මූලික මට්ටම වන අතර මූලික කරුණු හඳුනා ගැනීම සහ නැවත සිහිපත් කර ගැනීමක් අවශ්‍ය වේ. මෙම කොටස් කළමනාකරණ විෂය පථයෙන් පරිබාහිර ඒවා වන අතර ශිෂ්‍යයින්ගේ දැනුම කළමනාකරණ කණ්ඩායම සහ අනිකුත් සාමාජිකයින් සමඟ සංනිවේදනය කිරීමට සහ කාර්යයේ නිරතවිය හැකි මට්ටමක තිබිය යුතුය.

**අවබෝධය**

දැනුමට අමතරව ශිෂ්‍යයාට මාතෘකාව තේරුම්ගැනීමට හැකිබව පෙන්නුම්කල යුතුය. මෙහිදී ශිෂ්‍යයාගෙන් කළමනාකරණ ගණකාධිකාරීවරයෙකුට අදාලවන මට්ටමකට අනිකුත් අයට උපදෙස්දීමේ සහ මඟපෙන්වීමේ හැකියාව අපේක්ෂා කෙරේ.

**භාවිතය**

දැනුම සහ අවබෝධය භාවිතයෙන් ශිෂ්‍යයෙකුට අදාල ප්‍රමිත, මූලධර්ම සහ ශිල්පීයක්‍රම තෝරාගැනීමටත් දී ඇති ගැටළුවකට හෝ අවසථාවන් විසඳීමට හෝ යොදා ගැනීමට ඇති හැකියාව පෙන්නුම් කල යුතුය. සමහර දත්ත අදාල නොවන දත්ත පරාසයකින් ශිෂ්‍යයාට නිශ්චිත තොරතුරු තොරාගැනීමට හැකියාවක් තිබිය යුතුය. කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු සහ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් ශිෂ්‍යයාට වෘත්තිය විනිශ්චයක යෙදීමට ඇති හැකියාව පෙන්නුම් කල යුතුය.

**අධ්‍යයන භරිතය.**

විෂය නිර්දේශයේ එක් එක් කොටසට අධ්‍යයන භාරිතයක් බැගින් දී ඇත. මෙයින් අදහස් කරනුයේ නිශ්චිත මාතෘකාවකට අධ්‍යයනය සඳහා යෙදිය යුත්තේ කොපමණ කාලයක්ද යන්නය,

**මෙය ප්‍රශ්න පත්‍රයේ එම කොටසට වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ගැන ඇඟවීමක් නොකරයි.**